GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/12/15

**මාධ්‍ය නිවේදනයයි**

**උතුරු මැද පලාත් සෞඛ්‍ය අමාත්‍යවරයාගේ වගකීම් විරහිත ක්‍රියා කලාපය**

උතුරු මැද පලාත් සෞඛ්‍ය අමාත්‍ය එච්. බී සේමසිංහ මහතාගේ වගකීම් විරහිත නිදුගිලි ක්‍රියා පිලිවෙත සමස්ථ උතුරු මැද පලාත් සෞඛ්‍ය ක්ෂේත්‍රය තුල අර්බුදකාරී තත්ත්වයක් නිර්මාණය කර ඇත.

උතුරු මැද පලාත තුල පැතිර ඇති වකුගඩු රෝගයෙන් ජනතාව පීඩාවට පත්වෙද්දි පලාත් සෞඛ්‍ය අමාත්‍යවරයා ඒ සඳහා කිසිදු ප්‍රායෝගික විසඳුමක් හෝ යෝජනාවක් මේ වන තෙක් ඉදිරිපත් කර නැත. පලාත තුල දුෂ්කර රෝහල් වල වැඩිවෙමින් ඇති ගැටළු විසඳීමට කිසිදු උනන්දුවක් නොපෙන්වන පලාත් සෞඛ්‍ය අමාත්‍යවරයා පලාත තුල සිටින සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වංචාකාරී චරිත ආරක්ෂා කිරීම සඳහා නම් නිර්ලජ්ජිත ලෙස ඉදිරිපත්ව සිටියි.

වසර 02 කට අධික කාලයක් ඔඩු දුවමින් පවතින පොලොන්නරුව අර්බුදකාරී මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට සපයා ඇති රැකවරණය මීට කදිම නිදසුනකි.

මේ තත්ත්වය යටතේ උතුරු මැද පලාත තුල ඇති රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සියලු ශාඛා සංගම් විසින් පලාත් සෞඛ්‍ය අමාත්‍යවරයාට බරපතල චෝදනා ගණනාවක් ඉදිරිපත් කර ඇත.

ජාතික මැතිවරණයක් ප්‍රකාශයට පත්ව ඇති මොහොතක රජය අපහසුතාවයට පත් කිරීමේ උත්සාහයක පලාත් සෞඛ්‍ය අමාත්‍යවරයා නිරතව සිටින බව සැක සංකා මතුව ඇත.

මේ තත්ත්වය යටතේ පලාත් සෞඛ්‍ය අමාත්‍යවරයාට එල්ලවී ඇති චෝදනා පිළිබඳ කඩිනමින් විමර්ෂණය කොට උතුරු මැද පලාත තුල සෞඛ්‍ය ගැටලු විසඳීමට කටයුතු කරනා මෙන් අදාල බලධාරීන්ට අවධාරණය කරමු.

දෙසැම්බර් 22 වන දින වන විට මීට සතුටුදායක විසඳුමක් ලබාදීමට නොහැකි වුවහොත් නැවත දැනුම්දීමකින් තොරව සමස්ථ උතුරු මැද පලාතේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සාමාජික වෛද්‍යවරුන් අඛණ්ඩ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට එළඹෙනු ඇත.

මේ තුලින් පලාත තුල මහජනතාවට වන පීඩාව පිලිබඳ වගකීම උතුරු මැද පලාත් සෞඛ්‍ය අමාත්‍යවරයා ඇතුලු සියලු බලධාරීන් විසින් භාර ගත යුතු බව අවධාරණය කරමු.

ස්තූතියි,

වෛද්‍ය ලසන්ත ජිනදාස
ලේකම්

| | | |
|---|---|---|
| වැඩිදුර විස්තර සඳහා - | වෛද්‍ය නලින්ද හේරත් | - 0773495821 |
| | වෛද්‍ය හරිත අළුත්ගේ | - 0718121619 |